## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL 01 -2006 - ඒ) දෙපාර්තමේන්තුගත තනතුරුවල III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති රෝහල් හා ආයතනවල ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL – 01) දෙපාර්තමේන්තුගත පහත තනතුරෙහි පවතින පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අ/අ | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) | 1939 |

02. අවශ්‍ය සුදුසුකම්

tamilguru.lk

2.1. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්

(සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමේදී විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාගත් අධ්‍යාපන සහතික වල මුල් පිටපත් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.)

| අ/අ | තනතුර | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|
| 02 | සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම<br><br>හෝ<br><br>තනතුරට අදාළ ක්ෂේත්‍රයෙහි NVQ 3 මට්ටම හෝ ඊට ඉහළ මට්ටමක් ලබා තිබීම | අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ |

2.2. කායික සුදුසුකම්: - සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

2.3.වෙනත් :-

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ බවට අයදුම්පත්‍ර කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. වයස : අවුරුදු 18 නොඅඩු - අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

04. බඳවා ගැනීමේ ක්‍රමය :

4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : බඳවාගනු ලබන්නේ සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) III ශ්‍රේණිය සඳහා පමණි.

4.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය 100 | තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදාළ නොවේ. උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරා ගනු ලැබේ. |
| පළපුරුද්ද | 55 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 | |
| එකතුව | 100 | |

05. වැටුප් ව්‍යුහය හා වැටුප් පරිමාණය මාසික:

රුපියල් 40,000-10x450-10x490-10x540--12x590 -රු. 61,880 (PL 1–2006 - (ඒ)) (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 උපලේඛන (II) අනුව)(2026 වර්ෂයේ ආරම්භක වැටුප රු.38,863 වේ.)

06. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

(i) දැනට පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක වනුයේ කොළඹ, ගම්පහ, මහනුවර, නුවරඑළිය, ගාල්ල, යාපනය, අම්පාර, ත්‍රිකුණාමලය හා අනුරාධපුරය වන අතර බඳවා ගනු ලබන නිලධාරීන් සේවය කිරීමට කැමති ඉහත දිස්ත්‍රික්ක අතරින් දිස්ත්‍රික්ක 3ක් ප්‍රමුඛතාවය පරිදි පිළිවෙළින් සඳහන් කළ යුතු අතර පුරප්පාඩු ප්‍රමාණය හා අවශ්‍යතාවය මත ඔබ අයදුම් කරන දිස්ත්‍රික්කයම නොලැබී යා හැක. කුසලතාවය හා පවතින පුරප්පාඩු ප්‍රමාණය මත තෝරාගනු ලබන දිස්ත්‍රික්කය තුළ අනිවාර්යයෙන් වසර 5ක් සේවය කළ යුතුය.එම කාලය තුළ ස්ථානමාරු වීම් සළකා බලනු නොලැබේ.

(ii) තවද සේවා අවශ්‍යතාවය මත දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

(iii) පත් කරනු ලබන තනතුර ස්ථිරය. තෝරාගත් අයදුම්කරුවන්ට හිමි විශ්‍රාම වැටුප් පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුවේ. තවද, තෝරාගනු ලබන නිලධරයන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(iv) මෙම පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(v) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතුය.

(vi) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ විධිවිධානවලට ද, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL 01–2006 -ඒ) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියටද සෞඛ්‍ය හා ජනමාධ්‍ය ලේකම් විසින් නිකුත් කරන චක්‍රලේඛ හා පොදු විධිවිධානවලට ද මෙම පත්වීම යටත් වේ.

(vii) අයදුම්කරුවකු පත්වීම් ලැබීමට සුදුසුකම්ලත් භාෂා මධ්‍යය වනුයේ, එම අය විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

07. අයදුම් කළයුතු ක්‍රමය

(අ) සියලු අයදුම්කරුවන් තම අයදුම්පත වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සුදු A4 කඩදාසියක පිළියෙල කර තම භාෂා මාධ්‍යයෙන්ම සිය අත් අකුරින්ම පැහැදිලි ලෙස සම්පූර්ණ කර එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ"සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය නොවන (PL01-2006-ඒ) සේවා ගණය සෞඛ්‍ය කාර්ය සහායක (කණිෂ්ඨ) තනතුර සඳහා බඳවාගැනීම - 2025" යනුවෙන් සඳහන් කර **2026.01.12** දිනට පෙර හෝ එදිනට ලැබෙන පරිදි අධ්‍යක්ෂ (පාලන) 04 ශාඛාව, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (WWW.health.gov.lk වෙබ් අඩවියෙන් හෝ පහත QR කේතය සකැන් කිරීමෙන් අයදුම්පත බාගත කරගත හැක.)

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය : 2026.01.12

(ඇ) අයදුම්පත පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(ඈ) අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස් වීම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

08. අත්සන සහතික කිරීම:

රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ /අධ්‍යාපන පරිපාලන සේවයේ /රජයේ ගණකාධිකාරී සේවයේ රු. 703,920 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කර තිබිය යුතුය.

09. සාවද්‍ය තොරතුරු සැපයීම.

අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. යම් අයදුම්කරුවෙකු සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔහුගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් ඊට අදාළ නෛතික ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. බඳවාගැනීමේ කොන්දේසි:-

(i) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම 2026.01.12 දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් පත්වීම් ලැබීමට නුසුදුස්සෝ වෙති.

(ii) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ

(iii) අයදුම්පත් ලැබුන බව දන්වා එවනු නොලබන අතර ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

(iv) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර ඒ බව අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

(v) සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරාගනු ලබන අතර එසේ තෝරා ගන්නා ලද නිලධරයන් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින රෝහල් හා ආයතනවල පුරප්පාඩු සඳහා පත් කිරීමට නියමිතය.

සැලකිය යුතුය:-

(අ). අයදුම්පතේ සෑම වගන්තියක්ම පැහැදිලිව සම්පූර්ණ කර ඇති බව හා එම තොරතුරුවල නිවැරදි බව පිළිබඳ සහතික විය යුතුය.

(ආ). අයදුම්පතට කිසියම් ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවල දී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂයකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ. එසේ නොමැතිව අයදුම්පත්‍රයට කිසිසේත් සම්බන්ධ නොවන ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(ඇ). අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපැලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම දරාගත යුතුය.

(ඈ). සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව, තනතුරු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(ඉ). මෙම තනතුර සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් මෙම නිවේදනයෙන් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

(ඊ) එසේම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් හෝ පරස්පරතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2025 දෙසැම්බර් මස 18 වැනි දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.